දෙවසරක ප්‍රගතිය අඛණ්ඩව ඉදිරියට

# පුළුවන් ශ්‍රී ලංකා



කාන්තා අපේ බලය

**අපි වෙනුවෙන්, රට වෙනුවෙන්, හෙට වෙනුවෙන් එක අරමුණකට එකතුවෙමු.**

**රනිල් වික්‍රමසිංහ**
ரணில் விக்ரமசிங்ஹ
**Ranil Wickremesinghe**

# කාන්තා

## අපි වෙනුවෙන්
## ගනු ලැබූ ක්‍රියාමාර්ග හා
## ඉදිරි වැඩ පිළිවෙළ





# අභිමානවත් කාන්තාවනි,

ශ්‍රී ලංකාවේ සම්පූර්ණ ජනගහනයෙන් 52% ක් නියෝජනය කරන්නේ කාන්තාවන් බව කාන්තා අපි දන්නවාද? කාන්තාවන්ට කළ හැකි දේ පිළිබඳව අපිට නිවැරදි අවබෝධයක් තිබෙනවාද? රට සංවර්ධනය කිරීම හා රටේ අනාගත තීරණ ගැනීම පිළිබඳව කාන්තා අපිට ඇති බලය ගැන අපේ අවබෝධය කෙතරම්ද? මදක් නැවතී සිතමු, මේ කාන්තා අපේ බලය අන් කවරදාටත් වඩා භාවිත කළ යුතු අවස්ථාවයි. ඉතිහාසයක් පුරාවට  සෑම දුෂ්කර මොහොතකම රට  වෙනුවෙන් කාන්තාවන් සිදුකළ මෙහෙය අතිමහත් වන අතර එකී අභිමානවත් පරපුරක වර්ථමාන පුරුක්වන අපි මගේ රට, ඔබේ රට, අපේ රට වෙනුවෙන් එක්විය යුතු කාලය පැමිණ ඇත්තේය.

2022 වසරෙන් පසුව අපේ රටේ ආර්ථිකය අගාධයට යමින් ඉතා අපහසු කටුක කාලයක් පසුකළා අපිට මතකයි. ඒ කාල පරාසය තුළ  සමස්තයක් ලෙස වෙන කාටත් වඩා පීඩාවට පත්වූයේ කාන්තා අපිමයි. අසරණභාවයට පත්වූයේ කාන්තා අපිමයි. ජීවිතයේත්, සමාජයේත් විවිධ භූමිකාවන්ට පණ පොවන කාන්තා අපි ගෘහණියක් ලෙස නිවසේ අඩුපාඩු විඳ දරා ගනිමින්, දවස් ගණන් ගෑස් පෝලිම්වල හිඳිමින්, තෙල් පෝලිම්වල, ආහාර පෝලිම්වල හිඳිමින් බඩගිනි උහුලමින් දරුවන්ගේ, ස්වාමියාගේ අඩුපාඩු දැක දැක කඳුළු සඟවා හිනැහුණු කාලය අපිට මතකයි.

ඒ කටුක සමය නිමා කිරීමට පෙරමුණගත් කාන්තාවන්ට අපේ ගෞරවය නිතැතින්ම හිමිවිය යුතුයි. ඒ සමඟම එකී දුර්දාන්ත සමය අවසන් කරමින් සෑම මුවකටම සිහින් හසරැල්ලක් ගෙන ඒමට නායකත්වය සපයමින් රට නැවතත් ජයග්‍රහණයේ මාවතට රැගෙන එන්නට ජනපති රනිල් වික්‍රමසිංහ මහතාට පුළුවන් වූ බව අප තරයේ විශ්වාස කරනවා වගේම ඒ ගතවුණු දෙවසරෙහි සිදු කළා වූ විශිෂ්ට කාර්යභාරය මෙන්ම ශක්තිමත් කාන්තා පරපුරක් මෙන්ම සමෘද්ධිමත් අනාගතයක් වෙනුවෙන් එතුමාගේ ඉදිරි දැක්ම අපි දැනගත යුතුමයි.

කාන්තා අභිවෘද්ධිය මෙන්ම රටේ අනාගතය වෙනුවෙන් අපි සැවොම එක් අරමුණක් වෙනුවෙන් එකතු වෙමු. කාන්තාවන් වෙනුවෙන්, යහපත් අනාගතයක් හා සුබ හෙටක් වෙනුවෙන් කාන්තා අපි පෙළගැසෙමු. අපිට පුළුවන්.



# දෙවසරක ප්‍රගතිය

# ගෘහණී අපිට



## නිවාස හා ඉඩම්

- ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් මිලියන 6.8 අතරින් ආසන්නව 30%ක් ආවරණය කරමින් මිලියන 2කට ඉඩම් අයිතිය ලබාදෙන "උරුමය" වැඩසටහන.
- "රන්දොර" වැඩසටහන මගින් 250,000කට කොළඹ මහල් නිවාසවල අයිතිය ලබාදීමේ ව්‍යාපෘතිය.
- ඉන්දීය ආධාර යටතේ උතුරු නැගෙනහිර නිවාස අහිමි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන "භාරත-ලංකා" නිවාස ව්‍යාපෘතිය.
- වතු ජනතාව වෙනුවෙන් පර්චස් 10 බැගින් පවුල් 176,000කට ඉඩම් අයිතිය ලබාදෙන "සෞම්‍ය භූමි" ව්‍යාපෘතිය.
- විදේශගතව රැකියා කරන ශ්‍රී ලාංකිකයන් සඳහා රුපියල් මිලියන 10 දක්වා නිවාස ණය ලබාදෙන වැඩසටහන.

## පානීය ජලය

- පවුල් 80,000කට පිරිසිදු පානීය ජලය සපයන අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය.
- පුද්ගලයන් 300,000කට පිරිසිදු පානීය ජලය සපයන "යාපනයට ගංගාවක්" ජල සම්පාදන ව්‍යාපෘතිය.
- පුද්ගලයන් 169,000කට පිරිසිදු පානීය ජලය සපයන කෑගල්ල "අසුපිණි ඇල්ල" ජල සම්පාදන ව්‍යාපෘතිය.

## දෙවසරක ප්‍රගතිය

# ගෘහණී අපිට



### ජීවන වියදම

- අත්‍යවශ්‍ය භාණ්ඩ මිල අඩු කිරීම.
- විදුලි ගාස්තු අඩු කිරීම හා අඛණ්ඩ විදුලි සැපයුමක් ලබා දීම.
- ඉන්ධන, ගෑස් මිල සැළකිය යුතු ලෙස අඩු කරන ලදි.
- 2022 වර්ෂයේ 70%ක අගයක පැවති උද්ධමනය 2024 වර්ෂය වන විට 1.7% දක්වා අඩු කිරීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම.

---

- 2022 දී 30% වූ බැංකු පොලී අනුපාත 2024 වර්ෂය වන විට 9% දක්වා අඩු කිරීම.
- රන් ණය පොලිය වෙනුවෙන් 10%ක සහනයක් ලබා දීම.

---

- 2025 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය අංශයේ වැටුප් 24% - 50% ප්‍රතිශතවලින් වැඩි කිරීමට පියවර ගැනීම.
- රාජ්‍ය සේවයේ අවම වැටුප රු.55,000/= බවට පත් කිරීම.
- 2025 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි ජීවන වියදම් දීමනාව රු.25,000 බවට පත් කිරීම.
- පෞද්ගලික අංශයේ අවම වැටුප රු.17,000/= කිරීම.
- 2024 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි වතු කම්කරු දෛනික වැටුප රු.1700/= බවට පත් කිරීම.
- 2025 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාමිකයන් සඳහා රුපියල් 12,500/= ක ජීවන වියදම් දීමනාවක් ලබාදීම.

# ගෘහණී අපිට



## "අස්වැසුම"

- අයදුම්පත් මිලියන 3.3ක් අනුමත කරමින්, ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ වැඩි කරමින් "අස්වැසුම" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

## ළමා මන්දපෝෂණය අවම කිරීම

- මිලියන 1.6ක පාසල් සිසුන් වෙත නොමිලේ ආහාර ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

## අධ්‍යාපනය

- නව අධ්‍යාපන අවස්ථා මෙන්ම පහසුකම් නිර්මාණය කිරීම අරමුණු කරගනිමින් උසස් පෙළ සිසුන් 116,000ක් හා 01 වසරේ සිට 11 වසර දක්වා සිසුන් 100,000ක් ආවරණය කරමින් රුපියල් මිලියන 10,164ක වියදමින් ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

## සෞඛ්‍ය

- අඩු ආදායම්ලාභී පවුල්වල පුද්ගලයන්ගේ බරපතළ රෝගී තත්වයන් වෙනුවෙන් ආධාර සැපයීමට ජනාධිපති අරමුදල නැවත ආරම්භ කිරීම හා ප්‍රතිලාභ වැඩි කිරීම.
- පාසල් සිසුන් වෙනුවෙන් "සුරක්ෂා" වෛද්‍ය රක්ෂණ වැඩසටහන යළිත් ක්‍රියාත්මක කිරීම.

# ගෘහණී අපිට



## කාන්තා හා ළමා හිංසන මැඩපැවැත්වීම

- 604ක් වන දිවයිනේ සෑම පොලිස් ස්ථානයකම කාන්තා හා ළමා හිංසන මැඩපැවැත්වීම ගැන විශේෂ පුහුණුවක් සහිත නිලධාරිනියන්ගෙන් සමන්විත විශේෂිත අංශයක් දැනටමත් ස්ථාපනය කර ඇත.

## මත්ද්‍රව්‍ය මැඩපැවැත්වීම

- "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක කිරීම හා තවදුරටත් ශක්තිමත් කිරීම.
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් වෙනුවෙන් පුනරුත්ථාපන සේවා ක්‍රියාත්මක කිරීම.
- පාසල් අසල මත්ද්‍රව්‍ය, මත්පැන් සහ දුම්කොළ විකිණීම වැළැක්වීමට නීති ක්‍රියාත්මක කිරීම.

# දෙවසරක ප්‍රගතිය

## රැකියාවන්හි නිරත කාන්තා අපිට




- රැකියා ස්ථානයන්හි සිදු වන හිරිහැර වැළැක්වීමට කාන්තා සවිබල ගැන්වීමේ පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.
- විදෙස් රැකියාවල නිරත කාන්තාවන් වෙනුවෙන් සුබසාධන, පුහුණු, රක්ෂණ, නීති ආධාර ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## කාන්තා නායකත්වය වෙනුවෙන්



- කාන්තා අභිවෘද්ධිය හා අපේ ප්‍රශ්නවලට වඩාත් හොඳින් විසඳුම් ලබා දීම අරමුණු කරගනිමින් කාන්තා සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.
- රටේ ඉදිරි ප්‍රගමනය උදෙසා ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා කාන්තා නායකත්වය වැඩි කිරීම.

# අඛණ්ඩව ඉදිරියට



# කාන්තා අපි වෙනුවෙන්



## කාන්තා අපේ ආරක්ෂණය

- ස්ත්‍රී දූෂණ සහ ළමා අපචාර ඇප දිය නොහැකි වරදක් බවට පත් කිරීම.
- ස්ත්‍රී දූෂණ සහ ළමා අපචාර පිළිබඳ විශේෂ අධිකරණ පිහිටුවමින් නඩු කඩිනම් කිරීම.
- ගෘහස්ථ හිංසනය මැඩපැවැත්වීමට නීති ආධාර, වෛද්‍ය පහසුකම්, උපදේශන සේවා වෙනුවෙන් සෑම මැතිවරණ කොට්ඨාසයකටම කාන්තා මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- පරිපූර්ණ දරුවෙක් නිර්මාණය කිරීම හා වත්මන් සමාජ අභියෝගයන්ගෙන් දරුවන් සුරක්ෂිත කිරීම සඳහා "සුරකිමු ඔබ" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත ක්‍රියාත්මක කරමින් කාන්තා හා ළමා අපයෝජන වැළැක්වීම තවදුරටත් ශක්තිමත් කිරීම.
- හානියක් නොකරන මූලධර්ම කෙරෙහි අවධානය යොමු කරමින් "අහිංසා" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

## කාන්තා ගෘහමූලික අපිට

- කාන්තා ගෘහමූලික පවුල් වෙනුවෙන් රුපියල් මිලියනයක් දක්වා 3%ක සහන පොලියක් යටතේ ණය මුදලක් ලබාදෙමින් එම පවුල් නගාසිටුවීම.

## සනීපාරක්ෂක පහසුකම්

- වතු ජනතාව වෙනුවෙන් සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ඔවුන්ගේ ජීවන තත්වය නගාසිටුවීම.

# කාන්තා අපි වෙනුවෙන්



## කාන්තා හා ළමා හිංසන මැඩපැවැත්වීම

- ළමයින් උදෙසා ශාරීරික දණ්ඩනය පැනවීමට එරෙහිව නීති ක්‍රියාත්මක කිරීම.
- දිවයිනේ සෑම පොලිස් ස්ථානයකම දැනටමත් ක්‍රියාත්මක කාන්තා හා ළමා හිංසන මැඩපැවැත්වීම සඳහාවන වෙනම අංශය සයිබර් අපරාධ නිරීක්ෂණ පහසුකම් සහිතව තවදුරටත් ශක්තිමත් කිරීම.
- කාන්තා හා ළමා හිංසනයන් වෙනුවෙන් පෙනී සිටින හා අවම කිරීම වෙනුවෙන් වැඩ කරන රාජ්‍ය නොවන සංවිධානවලට වාර්ෂික දීමනාවක් පිරිනැමීම.

## රැකියාවන්හි නිරත කාන්තා අපි වෙනුවෙන්

- රැකියාවන්හි නිරත අපිට පහසුවක් සලසමින්, දරුවන්ගේ සුරක්ෂිත බව සහතික කරන දිවා සුරැකුම් සම්බන්ධව ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- නිදහස් වෙළඳ කලාප ආශ්‍රිත ලියාපදිංචි නවාතැන් නිවාස වැඩි දියුණු කිරීම සඳහා ණය පහසුකම් ලබාදීම.
- ජාත්‍යන්තර රැකියා වෙළඳපොළ ඉලක්ක කරමින් භාෂා හා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

## ව්‍යවසායක කාන්තා අපිට

- කාන්තාවන්ට ආර්ථික සවියක් හා හැකියා වර්ධනයට ILO ප්‍රමිතියට අනුකූල ව්‍යවසායක පුහුණුවක් ලබාදීම.
- සම-බෙදාගැනීමේ පදනමක් මත නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටුවීම.
- ලිංගික සමානාත්මතාවය, නව රැකියා උත්පාදනය හා දේශීය සම්පත් භාවිතයට ගැනීම ප්‍රවර්ධනය කරමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නියුතු වයස අවුරුදු 18-55 අතර කාන්තාවන් වෙනුවෙන් මාස 6ක සහන කාලයක් සහිත 6% පොලියට රුපියල් 150,000/= ක ණය මුදලක් ලබාදීම.
- කාන්තා ව්‍යවසායිකාවන් වෙනුවෙන් 12%ක පොලී අනුපාත යටතේ "ලිය සවිය" ණය වැඩසටහන යළි ක්‍රියාත්මක කිරීම.
- ආබාධිත කාන්තාවන්ගේ සමාජ - ආර්ථික තත්වයන් ඉහළ නැංවීම උදෙසා ක්‍රමවේදයන් සකසමින් ඒ සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

රටක් වෙනුවෙන් කරන
යෝජනාවලිය

**සිහිනයක්වත්**
**මුසාවක්වත්**
**මිත්‍යාවක්වත්**
**කළ නොහැක්කක්වත්**
**නොවිය යුතුයි**

මන්දයත්, එය ජනතාවගේ
වර්ථමානය මෙන්ම අනාගතයත්
අපේ රටේ ස්ථාවරත්වයත්
තීරණය කරන්නක් බැවිනි.

# කාන්තා අපේ බලය

රනිල් වික්‍රමසිංහ
ரணில் விக்ரமசிங்ஹ
**Ranil Wickremesinghe**

X

